# උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ

## පහත සඳහන් තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2019

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරුවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත්, උතුරු මැද පළාත තුළ ස්ථිර පදිංචි ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2019.03.14 වේ. මෙම තනතුරු වලට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019 අප්‍රේල් මාසයේදී පැවැත්වීමට අපේක්ෂිතය.

| තනතුර | පුරප්පාඩු ප්‍රමාණය | ස්ත්‍රී / පුරුෂ භාවය |
|---|---|---|
| • උපදේශන නිලධාරී | 01 | පිරිමි / ගැහැණු |
| • වෘත්තීය උපදේශක | 02 | පිරිමි 02 |
| • සහකාර මේට්‍රන් | 01 | ගැහැණු |
| • උප වෝර්ඩ්න් | 01 | පිරිමි |
| • අරක්කැමි | 02 | පිරිමි |
| • මුරකරු | 02 | පිරිමි |
| • කම්කරු | 05 | පිරිමි 02/ගැහැණු 03 |
| • සනීපාරක්ෂක කම්කරු | 03 | පිරිමි 02 / ගැහැණු 01 |

## උපදේශන නිලධාරී

**01. සුදුසුකම් :**

**i. අධ්‍යාපන සුදුසුකම් :**

අ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මනෝ විද්‍යාව, දර්ශනය හෝ සමාජ විද්‍යාව පිළිබඳ සාමාන්‍ය උපාධියක් සමග පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ ලියාපදිංචි ආයතනයකින් මනෝ විද්‍යාත්මක උපදේශනය (Psychological Counseling) පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**ii. පළපුරුද්ද :**

අ. රජයේ හෝ රජය පිළිගත් ආයතනයක උපදේශනය පිළිබඳ අවුරුදු 01 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**iii. වෙනත් සුදුසුකම් :**

අ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලනොපැවැත්වේ.

**02. තනතුරෙහි ස්වභාවය :**

i. අංක 3/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය (MN 4-2016) රු. 31,490-10x445-11x660-10x730-5x750 - 54,250 ක් වන අතර, ඉහත චක්‍රලේඛයේ උප ලේඛන II හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

ii. බඳවා ගන්නා ශ්‍රේණිය III ශ්‍රේණිය වේ.

**03. බඳවා ගැනීමේ ක්‍රමය :**

i. උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණු කුසලතා අනුපිළිවෙල මත මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පුරප්පාඩු ප්‍රමාණය අනුව මෙම තනතුර සඳහා බඳවා ගනු ලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ම සිදු කරනු ලැබේ.

**ii. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

**ලකුණු ලබාදීමේ ක්‍රමවේදය**

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 |
| 3. අමතර සේවා පළපුරුද්ද | 10 |
| 4. ඉංග්‍රීසි / දෙමළ භාෂා දැනුම | 10 |
| 5. පරිගණක සාක්ෂරතාවය | 10 |
| 6. විෂයානුබද්ධ දැනුම | 15 |
| 7. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය | 5 |
| එකතුව | 100 |

© THE ASSOCIATED NEWSPAPERS OF C

## උප වෝර්ඩ්න්

**04. සුදුසුකම් :**

**i. අධ්‍යාපන සුදුසුකම් :**

අ. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල භාෂාව / දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළත්ව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එකවරකදී විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.

සහ

ආ. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂය ධාරාවකින් අවම වශයෙන් විෂයයන් එකක් (01) හෝ සමත්ව තිබීම. (පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)

**ii. වෙනත් සුදුසුකම් :**

අ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලනොපැවැත්වේ.

ආ. රජයේ පිළිගත් ආයතනයකින් උපදේශනය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම හෝ රජයේ හෝ අනුබද්ධිත පෞද්ගලික රෝහලක සාත්තු සේවකයෙකු ලෙස වසර එකකට (01) වැඩි පළපුරුද්දක් ලබා තිබීම හෝ ස්වේච්ඡා ළමා නිවාසයක වසර තුනකට (03) නොඅඩු අඛණ්ඩ සේවා පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් වනු ඇත.

**05. තනතුරෙහි ස්වභාවය :**

i. අංක 3/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය (MN 1-2016) රු. 27,140-10x300-11x350-10x495-10x660-45,540 ක් වන අතර, ඉහත චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

ii. බඳවා ගන්නා ශ්‍රේණිය II ශ්‍රේණිය වේ.

**06. බඳවා ගැනීමේ ක්‍රමය :**

i. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයක ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙළ මත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඉන් මූලික සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන අනුව දිස්ත්‍රික් පදනම යටතේ බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පැවැත්වේ.

**ii. විභාග ක්‍රමය :**

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම හා විෂයානුබද්ධ දැනුම | පැය 02 | 100 | 40% |

**iii. විෂය නිර්දේශය :**

අ. ශ්‍රී ලංකාවේ පවත්නා අර්බුධ හා ගැටලු පවුල හා ළමයාට බලපා ඇති ආකාරය, ළමා අපචාර ඇතිවීමට හේතු හා ඒවා වැළැක්වීම සඳහා ගතහැකි පියවර පිළිබඳ සාමාන්‍ය දැනීම ප්‍රශ්න තුළින් විමසා බැලීම.

ආ. කණ්ඩායම් සාමාජිකයකු සේ වැඩ කිරීම, කණ්ඩායම් නායකත්වය, ආයතනික ව්‍යුහය, ආයතනික රැකවරණය, වැඩ පැවරීම, ළමා හා යෞවන අවශ්‍යතා, වාර්තාකරණය යන අංශ පිළිබඳ විෂය දැනුම මැන බැලීම.

## වෘත්තීය උපදේශක

**07. තනතුර - පහත ක්ෂේත්‍රයන්ට අදාළව වෘත්තීය උපදේශක තනතුරු සඳහා බඳවා ගැනේ.**

i. වඩු වැඩ පිළිබඳ වෘත්තීය උපදේශක (පිරිමි)

ii. පරිගණක අලුත්වැඩියාව පිළිබඳ වෘත්තීය උපදේශක (පිරිමි)

**08. සුදුසුකම් :**

**i. අධ්‍යාපන සුදුසුකම් :**

අ. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව / දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළත්ව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව ඕනෑම විෂයයන් 06 කින් සමත්ව තිබීම. ඉන් විෂයයන් 05 ක් එකවර සමත්ව තිබීම

සහ

ආ. අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් එක් විෂයයක් සමත්ව තිබිය යුතුය. (ඉංග්‍රීසි සහ පොදු ප්‍රශ්න පත්‍රය හැර)

**ii. වෘත්තීය සුදුසුකම් :**

ඉහත 6.1 හි සඳහන් සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් තමන් අයදුම්කරන වෘත්තීය උපදේශක තනතුරට අදාළව පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**අ. වඩු වැඩ පිළිබඳ වෘත්තීය උපදේශක (පිරිමි) :**

ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතනයක හෝ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ එක් වසරකට නොඅඩු පූර්ණ කාලීන වඩු වැඩ පිළිබඳ පාඨමාලාවක් හදාරා NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම

සහ

රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවුරුදු එකකට නොඅඩු සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**ආ. පරිගණක අලුත්වැඩියාව පිළිබඳ වෘත්තිය උපදේශක (පිරිමි) :**

ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතනයක පරිගණක අලුත්වැඩියාව පිළිබඳ එක් වසරකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

සහ

රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවුරුදු එකකට නොඅඩු සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**iii. වයස් සීමාව :**

අ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලනොපැවැත්වේ.

**09. තනතුරේ ස්වභාවය :**

i. අංක 3/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය (MN 1-2016) රු. 27,140 - 10x300-11x350-10x495-10x660 - 45,540 ක් වන අතර, ඉහත චක්‍රලේඛයේ උප ලේඛන II හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

ii. බඳවා ගන්නා ශ්‍රේණිය III ශ්‍රේණිය වේ.

**10. බඳවා ගැනීමේ ක්‍රමය :**

i. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයක ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඉන් මූලික සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන අනුව දිස්ත්‍රික් පදනම යටතේ බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පැවැත්වේ.

**ii. විභාග ක්‍රමය :**

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතාවය සහ භාෂා හැකියාව | පැය 01 | 100 | 40% |
| 2. සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |

**iii. විෂය නිර්දේශය :**

**අ. අභියෝග්‍යතාවය සහ භාෂා හැකියාව**

අපේක්ෂකයාගේ භාෂාමය හා සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය හා තීරණ ගැනීමේ හැකියාවන් පරීක්ෂා කිරීම සඳහා බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. එහි වාස්තවික (Objective type) ප්‍රශ්න 50 ක් ඇතුළත් වේ.

**ආ. සාමාන්‍ය දැනීම**

ආර්ථික, සමාජයීය, නව ලෝක ප්‍රවණතාවයන් පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න 50 කින් යුත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

## සහකාර මේට්‍රන්

**11. සුදුසුකම් :**

**i. අධ්‍යාපන සුදුසුකම් :**

අ. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හතරකට (04) සම්මාන සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම

සහ

ආ. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් විෂයයන් එකක් (01) සමත්ව තිබීම. (පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)

සහ

ඇ. රජයේ හෝ පිළිගත් ආයතනයක උපදේශනය / සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

EYLON LTD.ALL

ඈ. රජයේ අනුබද්ධිත පෞද්ගලික රෝහලක සාත්තු සේවිකාවක ලෙස වසර එකකට (01) වැඩි පළපුරුද්දක් හෝ උතුරු මැද පළාත තුළ පිහිටි ස්වේච්ඡා ළමා නිවාසයක මේට්‍රන් / සහකාර මේට්‍රන් ලෙස වසර දෙකකට (02) වැඩි සේවා කාලයක් සේවය කර තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

**ii. වෙනත් සුදුසුකම් :**

අ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලනොපැවැත්වේ.

**12. තනතුරේ ස්වභාවය :**

i. අංක 3/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය (MN 1-2016) රු. 27,140-10x300-11x350-10x495-10x660-45,540 ක් වන අතර, ඉහත චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

ii. බඳවා ගන්නා ශ්‍රේණිය III ශ්‍රේණිය වේ.

**13. බඳවා ගැනීමේ ක්‍රමය :**

i. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයක ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඉන් මූලික සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන අනුව දිස්ත්‍රික් පදනම යටතේ බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පැවැත්වේ.

**ii. විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතාවය | පැය 01 | 100 | 40% |
| 2. ළමුන්ගේ කායික මානසික සංවර්ධන පිළිබඳ ප්‍රශ්න පත්‍රය | පැය 01 | 100 | 40% |

**අ. අභියෝග්‍යතාවය**

අපේක්ෂකයාගේ භාෂාමය හා සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය හා තීරණ ගැනීමේ හැකියාවන් පරීක්ෂා කිරීම සඳහා වන බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. එහි වාස්තවික (Objective type) ප්‍රශ්න 50 ක් ඇතුළත් වේ.

**ආ. ළමුන්ගේ කායික මානසික සංවර්ධන පිළිබඳව ප්‍රශ්න පත්‍රය**

i. ළදරුවන්ට හා ළමුන්ට වැළඳෙන රෝග, සරල ප්‍රථමාධාර, එම රෝග වළක්වා ගැනීම සඳහා පිළිපැදිය යුතු සෞඛ්‍යාරක්ෂිත ක්‍රම

ii. ළදරු හා ළමාවියේ දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා හා ආහාර ලබාදීමේදී අනුගමනය කළ යුතු සෞඛ්‍ය පුරුදු

iii. ළදරු ළමාවියේ දරුවන්ගේ යහපත් මානසික වර්ධනය සඳහා කළ යුතු හා නොකළ යුතු කරුණු පිළිබඳ සාමාන්‍ය දැනුම.

## අරක්කැමි

**14. සුදුසුකම් :**

**i. අධ්‍යාපන සුදුසුකම් :**

අ. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් සමත්ව තිබීම.

**ii. වෘත්තීය සුදුසුකම් :**

අ. රජයේ ලියාපදිංචි ආයතනයක සූප ශාස්ත්‍රය පිළිබඳ මාස 03 කට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

ආ. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර එකකට නොඅඩු පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**iii. වෙනත් සුදුසුකම් :**

අ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**15. තනතුරේ ස්වභාවය :**

i. අංක 3/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය (PL 2-2016) රු. 25,250-10x270-10x300-10x330-12x350 - 38,450 ක් වන අතර, ඉහත චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

ii. බඳවා ගන්නා ශ්‍රේණිය III ශ්‍රේණිය වේ.

**16. බඳවා ගැනීමේ ක්‍රමය :**

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී ලකුණු කුසලතා අනුපිළිවෙළ මත මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 15/90 හි විධිවිධාන අනුව දිස්ත්‍රික් පදනම යටතේ මෙම තනතුර සඳහා බඳවා ගනු ලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ම සිදු කරනු ලැබේ.

**i. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබාදීමේ ක්‍රමවේදය**

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 2. අතිරේක පළපුරුද්ද | 60 |
| 3. තනතුරට අදාළව ලබා ඇති වෘත්තීය සුදුසුකම් | 15 |
| 4. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය | 05 |
| එකතුව | 100 |

කාර්යාලීය ප්‍රයෝජන සඳහා

# අයදුම්පත්‍රය

## උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ තනතුරු සඳහා විවෘත පදනමින් බඳවා ගැනීම - 2019

ඉල්ලුම් කරන තනතුර :

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය (සිංහල - 2, දෙමළ - 3)
අදාළ අංකය කොටුව තුළ ලියන්න
(භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ)

**01. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :**

(උදා: PERERA S.M.K.)

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) :

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

**02. ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) :**

**03. ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසියෙන්) :**

**04. ස්ත්‍රී / පුරුෂ භාවය :** පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

**05. දුරකථන අංකය :**
ජංගම : කාර්යාලීය :

06. 2019.03.14 දිනට වයස : අවුරුදු මාස දින

07. විවාහක / අවිවාහක බව :

**08. ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් :**

8.1 අට (8) වැනි ශ්‍රේණිය සමත්වී තිබේද ? :

8.2 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල

අ. විභාග වර්ෂය : විභාග අංකය :

| අනු අංකය | විෂයයන් | ලබා ඇති සාමාර්ථය | අනු අංකය | විෂයයන් | ලබා ඇති සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 01 | | | 06 | | |
| 02 | | | 07 | | |
| 03 | | | 08 | | |
| 04 | | | 09 | | |
| 05 | | | 10 | | |

(වෛකල්පිත විෂයන් ඇතුළත් නොකළ යුතුය)

8.3 අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල

අ. විභාග වර්ෂය : විභාග අංකය :

| විෂයයන් | ලබා ඇති සාමාර්ථය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

**09. ලබා ඇති අතිරේක අධ්‍යාපන සුදුසුකම් :**

**10. ලබා ඇති වෘත්තීය සුදුසුකම් :**

OF CEYLON LTD. ALL RIGHTS RESERVED.

10.1 පාඨමාලාව :
10.2 ආයතනය :
10.3 කාලසීමාව හා ප්‍රතිඵල වලංගු වන දිනය :

**11. ලබා ඇති පළපුරුද්ද පිළිබඳ තොරතුරු :**

අ. විෂය ක්ෂේත්‍රය :
ආයතනය :
කාලසීමාව :

ආ. විෂය ක්ෂේත්‍රය :
ආයතනය :
කාලසීමාව :

**12. ඔබ කවරදාක හෝ සාපරාධී චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කර තිබේද ?** ඔව් නැත
(අදාළ කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න)
ඉහත පිළිතුර "ඔව්" නම් විස්තර සපයන්න :

(ඒ බැව් සනාථ කරන ලිපි අමුණන්න)

**13. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :**

13.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :
13.2 ලදුපත් අංකය හා දිනය :
13.3 ගෙවූ මුදල (අකුරින්) :

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න<br>(ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගන්න) |

**14. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වුවෙකු නම්,**

14.1 දෙපාර්තමේන්තුව / ආයතනය :
14.2 දැනට දරන තනතුර :
14.3 මුල් පත්වීම් දිනය :
14.4 සේවා කාලය : අවු.
14.5 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන වග :

**15. අයදුම්කරුගේ ප්‍රකාශය :**

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බවත්, විභාග ගාස්තුව ගෙවූ ........................ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක ........................ හා ............ දින දරන ලදුපත මෙහි අලවා ඇති බවත්, මෙම තනතුරට මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසු හෝ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම පිළිගනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය :

අයදුම්කරුගේ අත්සන

**16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................ මයා / මිය / මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ........................ වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය :

සහතික කරන්නාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ නම :
තනතුර :
ලිපිනය : (නිල මුද්‍රාව තබන්න)

(පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් තොරතුරු දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය)

**17. දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................ මයා / මිය / මෙනවිය ........................ කාර්යාලයේ / ආයතනයේ ........................ දින සිට ........................ තනතුරක සේවය කරන බවද, ඔහුගේ / ඇයගේ සේවය සතුටුදායක බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි බවද / කළ නොහැකි බව ද ඔහු / ඇය මෙතෙක් මොනයම් ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බවද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ද සහතික කරමි.

දිනය :

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නම :
තනතුර :
(නිල මුද්‍රාව තබන්න)